**කටුවන ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 07 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට කටුවන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී ඉදිකළ කොම්පෝස්ට් අංගනයේ පිරිවැය රු. 35,584,995 ක් වැඩියෙන් ප්‍රාග්ධනිත කර තිබුණි. | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |

(ii) පහත සඳහන් ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

| වත්කම් විස්තරය | වටිනාකම<br>රු. | | |
|---|---|---|---|
| කොම්පොස්ට් අංගනයේ ගබඩා කාමරය | 1,785,349 | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |
| කටුවන සති පොළ පොදු වැසිකිළිය | 1,107,363 | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |
| 2016, 2017 හා 2018 වර්ෂයන් වලදී ඉඩම් වෙන්දේසි වලින් ප්‍රාදේශීය සභාවට පවරා දී තිබූ ඉඩම් 03 | 300,000 | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |

| | | | |
|---|---|---|---|
| (iii) | 2011 වර්ෂයේදී පරිත්‍යාගයක් ලෙස ලැබුණු ට්‍රැක්ටරය සහ 2013 වර්ෂයේදී ඝණ අපද්‍රව්‍ය ව්‍යාපෘතිය සඳහා පවරා දී තිබූ අක්කර 03 ක ඉඩමෙහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | සියලුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |

**(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු. 15,569,888 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | විස්තරාත්මක උපලේඛනය සහ කාල විශ්ලේෂණය ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරමි |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | රීති 177 | කිරම වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 25 ක් බදු දීමේදී ටෙන්ඩර් ක්‍රියා පටිපාටිය අනුගමනය කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කඩ කාමර ඉල්ලුම්කරුවන්ගේ නාම ලේඛනය මහ සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන ප්‍රධාන අමාත්‍යතුමාගේද අනුමැතිය ලැබීමෙන් පසු මෙම කඩ කාමර ලබාදෙන ලදී |

| | | | | |
|---|---|---|---|---|
| | රීති 185 | සභාවේ පැවති ජංගම ගිණුම් 05 ක පැවති අතිරික්ත මාසික සාමාන්‍ය මුදල් ශේෂයන් පිළිවෙලින් රු.4,754,631 ක්, රු.7,075,839 ක්, රු.2,127,604 ක් රු.6,064,573 ක් හා රු.651,674 ක් වුවත් ඉන් කොටසක් හෝ ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අතිරික්තව පවතින මුදලින් රු. 7,500,000 ක් සේවක ණය ගිණුමට මාරු කර පොරොත්තු ලේඛනයේ රැඳී සිටින සේවකයින්ට ආපදා ණය ලබාදෙන ලදී |
| | රීති 193 | අයවැය සමඟ අය හා වැය විෂයයන් සඳහා අතිරික්තතා හා ඌණතා වලට හේතු දැක්වෙන ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අයවැයගත හා සත්‍ය තොරතුරු සැසඳීමේ ලේඛනයක් 2019 අවසන් ගිණුම් සකස් කිරීමේදී ඉදිරිපත් කරමි |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 13 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වාහන 05 ක ඉන්ධන පරීක්ෂාව සිදුකර අවසන්ව ඇති අතර ඉතිරි වාහනවල ඉන්ධන පරීක්ෂාව හැකි ඉක්මනින් සිදු කරමි |
| (ඇ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/ 2010/01 දරන චක්‍රලේඛයේ 05 ඡේදය | කඩ කාමර ගිවිසුම් වසර 3 කට වරක් යාවත්කාලීන කළ යුතු වුවත් කඩ කාමර 18 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මිද්දෙනිය රාජපක්ෂ සුපිරි වෙළඳ සංකීර්ණයේ 01-08 කඩ කාමර දක්වා හැර ඉතිරි කඩ කාමර ගිවිසුම්ගත වී ඇති අතර ඉහත කඩ කාමර 08 සඳහාද ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය ලද පසු ගිවිසුම්ගත වීමට කටයුතු කරමි |

## 2. මූල්‍ය සමාලෝචනය
---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම, රු.19,982,789 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.21,428,629 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 902,200 | 1,088,533 | 1,086,703 | 2,020 | 56,400 | 1,044,512 | 1,046,772 | 1,830 |
| කුලී | 13,462,100 | 12,646,360 | 12,722,807 | 1,481,747 | 14,502,590 | 11,626,932 | 12,615,922 | 1,558,194 |
| බලපත්‍ර ගාස්තු | 724,050 | 1,217,419 | 1,218,119 | 48,950 | 1,528,200 | 1,517,396 | 1,577,896 | 49,650 |
| වෙනත් ආදායම් | 17,508,800 | 31,958,936 | 21,467,516 | 43,245,392 | 16,144,800 | 28,989,608 | 19,415,169 | 32,753,972 |
| එකතුව | 32,597,150 | 46,911,248 | 36,495,145 | 44,778,109 | 32,231,990 | 43,178,448 | 34,655,759 | 34,363,646 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ ආදායම රු. 34,363,646 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු. 46,911,248 ක් විය. ඒ අනුව වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු. 81,274,894 ක් වුවද, වර්ෂය තුළ රැස්කරන ලද ආදායම රු. 36,495,145 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 45 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | හිඟ මුද්දර ගාස්තු හා හිඟ ජල ගාස්තු නිසා හිඟ ආදායම් ප්‍රතිශතය වැඩි විය |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2004ජුනි 22දිනැති අංක 9/1346දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් දියුණු ප්‍රදේශ ප්‍රකාශයට පත්කර තිබුණද ,ප්‍රාදේශීය සභා පනතේ 134වගන්තිය ප්‍රකාරව වරිපනම් බදු පනවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වරිපනම් බදු අයකිරීමට කටයුතු කළ යුතුවේ. | දේපල තක්සේරු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා ඇති අතර තක්සේරු වාර්තාව ලැබුණු පසු අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරමි |

**2.2.4 කුලී**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු කඩ කාමර 15 කින් ලැබිය යුතු කඩ කුලී රු. 431,350 ක් සහ යතුරු මුදල් රු. 9,924,333 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී අයකර ගත යුතුවේ. | හිඟ මුදලින් රු. 1,035,950 ක් අයවී ඇති අතර ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී සභාව සතු මිද්දෙනිය රථවාහන නැවතුම් ස්ථානය බදු දීමෙන් ලැබිය යුතු රු. 106,750 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී අයකර ගත යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීමට බදුකරුට එරෙහිව නඩු පවරන ලදී |

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 1,983,923 ක් හා රු. 35,595,163 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ වලින් රු.1,675,323 ක් ද මුද්දර ගාස්තු වලින් රු. 324,677 ක්ද අයවිය |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ජාතික පරිසර පනතට අදාළව 2000 අංක 53දරන නව ගැසට් සංශෝධනයට අනුව නිකුත් කළ 2008ජනවාරි 25 දිනැති අංක 16/1553දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුකූලව අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගත යුතුවේ. | අඩුපාඩු සකස් කිරීමෙන් පසුව 2019 අප්‍රේල් 30 දින පරිසර බලපත්‍රය ලබා ගැනීමට අයදුම් පත්‍රයක් ඉදිරිපත් කරන ලදී. |

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | අයවැයෙන් මුදල් වෙන්කර ගෙන දරුවන්ගේ හා මව්වරුන්ගේ පෝෂණය නංවාලීම, රෝග මර්ධනය ආදී වැඩසටහන් සිදු කරන අතර මෙම කරුණුවලට අදාළ සැලසුම් සිව් අවුරුදු සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු සිදු කරමි |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාවේ අතිරික්ත සේවකයින් 02 ක් විධිමත් කර ගැනීමට සහ 21 දෙනෙකුගේ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | කණිෂ්ඨ සේවයේ පවතින පුරප්පාඩු වලින් තනතුරු 07 ක් සඳහා බඳවා ගැනීම් මේ වන විට සිදු කර ඇති අතර අතිරික්ත එක් තනතුරක් සඳහා 25/2014 චක්‍රලේඛය මගින් පත්වීම් ලබා දී ඇති අතර වෛද්‍ය හේතු තම සේවය හැරගිය පුද්ගලයෙකු නැවත සේවයේ පිහිටුවීම නිසා තවත් තනතුරක අතිරික්තයක් පවතී |
| (ආ) | සභාවේ නිලධාරීන් 16 දෙනෙකු අනුමත රාජකාරි වලින් බැහැර රාජකාරීවල යොදවා තිබුණි. | අනුමත රාජකාරිවල යෙදවිය යුතුවේ. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවන ආකාරයට කටයුතු කරමි |
| (ඇ) | සේවය හැරගිය, මිය ගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 10 දෙනෙකුගෙන් අයවිය යුතු එකතු වටිනාකම වූ රු. 589,068 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි . | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ස්ථාන මාරු ලබා යන නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ ,මුද්දර ගාස්තුවලින් හිලව් කිරීමට ප්‍රධාන ලේකම් නිකුත් කරන ලද ලිපිය මගින් දැනුම් දී ඇති අතර, සේවය හැර ගොස් සිටින නිලධාරීන්ගෙන් අයවිය යුතු |

| | | |
|---|---|---|
| | | මුදල් ගෙවීමට ඔවුන්ට සිහි කැඳවීම් නිකුත් කරන ලදී |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මිද්දෙනිය හා කිරම කඩ කාමර 32 ක් සඳහා 2012 සහ 2014 වර්ෂයන් වලදී තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබූ තක්සේරුව ඉදිරි වර්ෂ 02 ක් සඳහා පමණක් බල පැවැත්වෙන බව සඳහන් කර තිබියදීත් සමාලෝචිත වර්ෂයේදීත් එම තක්සේරුව මත කඩ කුලී අයකර තිබුණි. | නව තක්සේරුවක් ලබා ගෙන කඩ කුලී අයකර ගත යුතුවේ. | නව තක්සේරුවක් ලබා දෙන ලෙස ඉල්ලා ඇතත් තක්සේරු වාර්තාවක් මේ වන විටත් නොලැබුණි |
| (ආ) | සභාව සතු පොළවල් 09 ක් ටෙන්ඩර් කර බදු දීමට කටයුතු නොකර කොමිස් ගෙවීමේ පදනම මත බඳවා ගෙන තිබූ සේවකයින් 06 දෙනෙකු යොදවා පොළ බදු අයකර තිබුණි. | සභා ආදායම් විධිමත්ව එකතු කිරීම සඳහා සභාව සතු පොළවල් ටෙන්ඩර් කර බදු දීමට කටයුතු කළ යුතුවේ. | පොළවල් සඳහා ඍජු ශ්‍රම පදනම මත බදු අය කිරීමට ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය 2010 අගෝස්තු 16 දිනැති ලිපියෙන් ලද අතර 2019 වර්ෂයේදීත් ඍජු ශ්‍රම පදනම මත බදු අයකිරීමට සභාව තීරණය කරන ලදී |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වාහන 08 ක් දීර්ඝ කාලයක සිට අක්‍රියව පවතින අතර, ඒවා අලුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අක්‍රියව පවතින වාහන අළුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | RC – 7796 ට්‍රැක්ටරය භාවිතයට ගන්නා අතර, 270 - 0429 ට්‍රැක්ටරය අලුත්වැඩියාවට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. අත්ට්‍රැක්ටර් 02 ක් සභාවට පවරා ගෙන වෙන්දේසි කිරීමට කටයුතු කරන අතර ජල බවුසර් කඳන් තුනද ඉදිරියේදී වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |

**3.4.2 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා කටයුතු සඳහා යොදවා ගනු ලබන වාහන 09 ක සහ සුසාන භූමි 57 ක නීත්‍යානුකූල අයිතිය 2018 දෙසැම්බර් 31 දින වන විටත් පවරා ගෙන නොතිබුණි. | වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පවරා නොගත් වාහන අතුරින් 53-1634 අංක දරන වාහනය පවරා ගැනීමේ කටයුතු සිදු කරන අතර සුසාන භූමි පවරා දෙන ලෙස කටුවන හා වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් |

| | | |
|---|---|---|
| | | කාර්යාල වෙත දන්වා ඇති නමුත් මෙතෙක් පවරා දී නැත. |

**3.4.3 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015වර්ෂයේදී සභාවට භාර දී තිබූ වටිනාකම රු. 9,984,179ක් වූ කටුවන සති පොළ ගොඩනැගිල්ල වර්ෂ 04 ක කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | පොදු පහසුකම් හා ආරක්ෂිත වැට නොතිබූ බැවින් පොළ විවෘත නොකරන ලද අතර 2019 වර්ෂයේදී පොළ විවෘත කරමි |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වියදම් විෂයයන් 02 ක අයවැයගත සීමාව ඉක්මවා රු. 328,711 ක වියදම් දරා තිබුණු අතර එය සියයට 42 සිට සියයට 50 ක පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු ලේඛන පිළියෙල කළ යුතුය. | මෙවැනි අඩුපාඩු ඇති නොවන ආකාරයට කටයුතු කරමි |
| (ආ) | වියදම් විෂයයන් 02 ක එකතුව රු. 2,920,149 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර එය සියයට 39 සිට සියයට 45 ක පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු ලේඛන පිළියෙල කළ යුතුය. | මෙවැනි අඩුපාඩු ඇති නොවන ආකාරයට කටයුතු කරමි |
| (ඇ) | ආදායම් විෂයයන් 03 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 8,790,530 ක් වූ අතර එය සියයට 06 සිට සියයට 18 ක් දක්වා පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු ලේඛන පිළියෙල කළ යුතුය. | මෙවැනි අඩුපාඩු ඇති නොවන ආකාරයට කටයුතු කරමි |